**ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

-----------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 02 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 15 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසය තුල කර්මාන්ත දෙකක් සඳහා ගෙවීම් කිරීමට එකතුව රු. 740,523 ක මුදලක් ලැබී තිබූ අතර එම මුදල රු. 790,242 ක් ලෙස රු. 49,719 ක් වැඩියෙන් ලෙජරයට පිටපත් කර තිබුණි.

(ආ) මග නැගුම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 07 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු සහ ගෙවියයුතු රු. 3,497,920 ක මුදලක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) මුද්දර ගාස්තු ගිණුම් තැබීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම රු. 290,000 ක් වුවද ආදායම් හා වියදම් ගිණුමට රු. 1,076,244 ක මුදලක් බැරකර තිබුණි.මෙම ශේෂය තුල 2008 වර්ෂයට අදාලව ලැබී තිබූ රු. 869,744 මුදලක්ද ඇතුළත්ව තිබුණි.

ii. සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ මුද්දර ගාස්තු ආදායම රු. 516,925 ක් වුවද ගිණුම අනුව එය රු. 264,500 ක් විය. ඒ අනුව රු. 252,425 ක් අඩුවෙන් ගිණුම්ගත කර ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) 2012 වර්ෂය සඳහා වාර්ෂික නඩත්තු වියදම් ලෙස පෞද්ගලික ආයතනයකින් 2013 පෙබරවාරි 06 දින ලැබී තිබු රු. 25,000 ක මුදලක් සමුච්චිත අරමුදලට ගැලපීම් කිරීමට ක්‍රියා නොකර වර්ෂයේ ආදායමක් ලෙස 1/60 වෙනත් ආදායම් ගිණුමට බැරකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාලව 2014 පෙබරවාරි 20 දින දැන්වීම් පුවරු ගාස්තු ලෙස පෞද්ගලික ආයතනයකින් රු. 40,000 ක මුදලක් ලැබී තිබු අතර මෙම මුදල සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගතකර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද පෙර වර්ෂ වලට අදාල රු. 25,401 ක වියදම් සමුච්චිත අරමුදලට හර නොකර වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමෙන් රු. 250,000 ක මුදලක් සභා අරමුදලට මාරුකර තිබුණ අතර එය මුදල් ගිණුමට හර නොකර ජර්නල් සටහන් 10 මගින් වෙනත් ආදායම් ගිණුමට හරකර තිබුණි. 2013 ඔක්තෝබර් 15 දිනැති අංක 9740 ලදුපතේ වෙනත් ආදායම් (1-60) ගිණුමට බැර කර තිබුණි.

(ඌ) වර්ෂය අවසානයට පැවැති රු. 21,590 ක උපකරණ හා ලිපිද්‍රව්‍ය අවසන් තොගයට ගෙන නොතිබුණි.

**1.3.3 නොසැසඳුනු පාලන ගිණුම්**

------------------------------

ගිණුම් විෂයයන් 06 කට අදාලව පාලන ගිණුම් හා උපයෝගී ලේඛන අතර රු. 43,622 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

එකතුව රු. 24,279,522ක් වු ගනුදෙනු සම්බන්ධයෙන් අවශ්‍ය උපලේඛන, යාවත්කාලීන කරන ලද ලේඛන , ශේෂ සහතික , කාලවිශ්ලේෂණ හා බැංකු පාස්පොත් යනාදි තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2. මුල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මුල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වු පුනරාවර්තන වියදම රු. 60,538 ක් වු අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 547,840 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 449,592 ක මුදලක් උසාවි දඩ සහ මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කොන්ත්‍රාත් පරිපාලනය**

පිළිසරු ව්‍යාපෘති මගින් ක්‍රියාත්මක කරනු ලබන කුඩා පරිමාන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර සැපයීමට මධ්‍යම පරිසර අධිකාරිය විසින් එකඟ වී තිබූ අතර මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයාගේ 2012 නොවැම්බර් 01 දිනැති ලිපිය මගින් ඉදිකිරීම් කටයුතු 12 ක් සඳහා රු. 5,171,134 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණි.

i. ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා 2012 නොවැම්බර් 01 දින රු. 984,978 ක අත්තිකාරම් මුදලක්ද ලබාදී තිබූ මුත් විගණන දිනය වූ 2014 පෙබරවාරි 13 දින වන විටත් නිමකර තිබුණේ කාර්යයන් තුනක් පමණි.
ii. ප්‍රතිපාදන අනුමත කර සහ අත්තිකාරම් මුදල් ලබාදී වර්ෂයකට වැඩි කාලයක් ගත වී ඇතත් විගණන දිනය වූ 2014 පෙබරවාරි 13 දින වන විටත් අනෙකුත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම හා වෙනත් ක්‍රියාමාර්ගයක් හෝ ගෙන නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

(අ) වාර්ෂික අයවැය ලේඛනය මගින් ලඟා කරගැනීමට අපේක්ෂා කර තිබූ ආදායම් ඉලක්ක ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබූ අතර අයවැයගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර ඉහල විචලනයක් පෙන්නුම් කෙරුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල ඉටු කිරීමට අපේක්ෂා කරනු ලබන සංවර්ධන යෝජනා කිසිවක් අයවැය ලේඛනය තුල දක්වා නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය